**පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ (මධ්‍යම හා සබරගමුව පළාත්) 2010 සැප්තැම්බර් 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළබඳ විගණකාධිපති වාර්තාව**

---

1. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 04 ක කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

----------------

2.1 **මූල්‍ය කාර්ය සාධනය**

-----------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, 2010 සැප්තැම්බර් 01 සිට 2010 දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.15,153,310 ක් විය. 2010 සැප්තැම්බර් 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | 2010 සැප්තැම්බර් 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණම් කාල පරිච්ජේදය සඳහා වියදම |
|---|---|
| | රු. |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | 225,919 |
| බැදීම් ගාස්තු | 1,991,198 |
| පරිපාලන පිරිවැය | 12,936,193 |
| එකතුව | 15,153,310 |

## 2.2 විශේෂ (යෙන්) ගිණුම

2010 සැප්තැම්බර් 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ජේදය සඳහා විශේෂ (යෙන්) ගිණුමෙන් ගනුදෙනු කිසිවක් සිදු වී නොතිබුණි.

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය බලපැවැත්වෙන දිනය 2010 ජූලි 14 දින වුවද, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර තිබුණේ 2010 සැප්තැම්බර් මාසයේදීය.

(ආ) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ජේදය තුළදී ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා ඉලක්ක සපුරා ගැනීමට වගකිව යුතු නිලධාරීන්ද ඇතුළත්ව කාර්තුමය, අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වමින් සම්පූර්ණ ව්‍යාපෘති කාල පරිච්ජේදය ආවරණය වන පරිදි විස්තරාත්මක ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති සිහිවටන සටහනේ දක්වා ඇති කාල පරිච්ජේදයට අනුව, 2010 සැප්තැම්බර් අවසානය වනවිට සිවිල් වැඩ උපදේශකවරු 5 දෙනෙකු පත්කළ යුතුය. කෙසේ වුවද, 2011 ජූලි 31 වනවිටත්, එම පත්වීම් සිදු කර නොතිබුණි.

(ඈ) ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 3 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත කාල පරිච්ජේදයේ දින 103 ක් සඳහා ගෙවිය යුතු රු.3,536,095 ක් වූ බැදීම් ගාස්තු තහවුරු කරගෙන ගිණම්වලට ගෙන නොතිබුණි.